සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022
## Practice Test - Grade 13 - 2022

චිත්‍ර කලාව - I,II,III

51 S I

කාලය: පැය තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබාදෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

විභාග අංකය: .................................................

**උපදෙස් :-**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.

I කොටස

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා, ඒහි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

II කොටස

* අනු කොටස් තුනකින් සමන්විතය''අ'' කොටසින් ප්‍රශ්ණ 2ක් හා ''ආ'' සහ ''ඉ'' යන කොටස් දෙකෙකින් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්ණ හතරකට පිළිතුරු සපයන්න.

* ප්‍රශ්න 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නවලට වඩාත් නිවරදි පිළිතුර තෝරන්න.
*

01. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර ''එක් අලි රූපයක කකුල්වල පතුල සුදු පැහැයෙන් විස්තරාත්මකව'' (රවුම් කර) දක්වා ඇත්තේ
   1. තන්තිරිමලේ ගුහාවේය.
   2. වෙට්ටම්බුගල ගුහාවේය.
   3. දොරවක ගුහාවේය.
   4. බටදොඹලෙන ගුහාවේය.
   5. බිල්ලෑව ගුහාවේය.

02. චෛත්‍ය වටා පිළිම ගෙවල් 8ක් දක්නට ඇති පොළොන්නරු යුගයට අයත් ස්ථූපය වන්නේ,
   1. රන්කොත් වෙහෙරයි.
   2. කිරිවෙහෙරයි.
   3. හඟුරන්කෙත පොත්ගුල් විහාර ස්තූපයයි.
   4. ගිරිහඬු සෑයයි.
   5. දෙමළ මහා සෑයයි.

03. භාරතයේ මෞර්යය යුගයේ ඉදවී, ඉන්දීය රාජ්‍ය ලාංඡනයට ද යොදා ඇති ස්ථම්භ ශීර්ෂය වන්නේ,
   1. ලෞරියා නන්දගර් ස්තම්භ ශීර්ෂයයි.
   2. සාරානාත් ස්ථම්භ ශීර්ෂයයි.
   3. රම්පුර්වා ස්තභ ශීර්ෂයයි.
   4. සාංචි ස්ථම්භ ශීර්ෂයයි.
   5. වෛශාලිය ස්ථම්භ ශීර්ෂයයි.

04. යුරෝපීය නූතනවාදී කලාව ආභාෂය කරගත් ශිල්පියෙකු වූ ''ෆ්.මාර්ක්'' කළ නිර්මාණය වන්නේ,

1. බල්ලා සහ පොකිරිස්සා නැමති සිතුවමයි.
2. බිඳුනු ඔරු නැමති සිතුවමයි.
3. කරල් අහුලන්නී නැමති සිතුවමයි.
4. මිනිසා සහ බල්ලන් නැමති මූර්තියයි.
5. කුඹල්හල නැමති සිතුවමයි.

05. භාරුත් ගල් වැට කැටයම් අතර දක්නට ලැබෙන කැපී පෙනෙන ලක්‍ෂණය වනුයේ,

1. ජාතක කතා හා බුද්ධ චරිත සිද්ධි දැක්වීමයි.
2. යක්‍ෂ යක්ෂණී රූප දැක්වීමයි.
3. බුදුරජාණන් වහන්සේ වෙනුවට සංකේත භාවිතයයි.
4. වෘත්තාකාර රාමු තුළ රූප මතුකර දැක්වීමයි.
5. ජාතක කතා සඳහා සත්ත්වයෙකු නිරූපනය කරන බෝධිසත්ත්ව අවස්ථා පමණක් යෙදීමයි.

*** ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර අංක 1 සිට 7 තෙක් අංකනය කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරින් තෝරන්න.**


1


2


3


4


4


5


6

06. යුරෝපීය ක්‍රමවේද අනුගමනය කර ඇති අතර ඇඳුම් පැළඳුම් ආදිය ඉන්දීය සංස්කෘතික ලක්‍ෂණ පෙන්වන සිතුවමකි.

1. 5
2. 4
3. 1
4. 3
5. 2

07. 43 කණ්ඩායමට අයත් චිත්‍ර ශිල්පීන්ගේ සිතුවම් මොනවාද?

1. 5, 6
2. 1, 3
3. 2, 7
4. 2, 4
5. 1, 5

08. ඝනිකවාදී ක්‍රමවේද අනුගමනය කරමින් නිර්මාණය කළ සිතුවම් මොනවාද?

1. 1, 2
2. 1, 5
3. 3, 6
4. 5, 7
5. 6, 7

09. යුරෝපීය ශාස්ත්‍රාලයීය ක්‍රමවේද අනුගමනය කරමින් නිර්මාණය කළ සිතුවම් මොනවාද?

1. 1, 2, 3
2. 2, 4, 5
3. 3, 4, 6
4. 4, 5, 6
5. 3, 5, 6

10. මේ අතරින් විදේශීය චිත්‍ර ශිල්පීන්ගේ සිතුවම් මොනවාද?

1. 1, 4, 5, 7 2. 2, 5, 6, 7 3. 3, 4, 5, 6 4. 4, 5, 6, 7 5. 2, 2, 6, 7

*** ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර A, B, C, D, E ලෙස නම් කර ඇති පහත සඳහන් චිත්‍ර ඇසුරෙන් තෝරන්න.**


A


B


C


D


E

11. A අක්ෂරයෙන් දැක්වෙන සිතුවම
    1. රුවන්වැලිසෑයේ ගර්භය තුළින් සොයාගත් සිතුවම් කොටසකි.
    2. අභයගිරි විහාරයේ ප්‍රතිසංස්කරණය තුළින් සොයාගත් සිතුවම් කොටසකි.
    3. ගොනාගොල්ල විහාරයෙන් සොයගත් සිතුවම් කොටසකි.
    4. මහියංගන ධාතු ගර්භයෙන් සොයාගත් සිතුවම් කොටසකි.
    5. හිඳගල විහාරයේ පැරණි යුගයට අයත් සිතුවම් කොටසකි.

12. B අක්ෂරයෙන් දැක්වෙනුයේ,
    1. දෙගල්දොරු විහාරයේ වෙස්සන්තර ජාතකයේ සිතුවමකි.
    2. දඹුලු විහාරයේ විජයාවතරණය දැක්වෙන සිතුවමකි.
    3. දිඹුලාගල මාරවිදියේ වෙස්සන්තර ජාතකය සිතුවම් කොටසකි.
    4. මැදවල ටැම්පිට විහාරයේ උරග ජාතකයේ සිතුවම් කොටසකි.
    5. පොළොන්නරු තිවංක පිළිමගෙයි චූල්ල පදුම ජාතකයේ සිතුවමකි.

13. C අක්ෂරයෙන් දැක්වෙන මෙම සිතුවමින් උපස්තිථිවාදයට වඩා පශ්චාත් උපස්ථිතිවාදී ලක්ෂණ පෙන්වන මෙම සිතුවම
    1. කාන්තාවගේ විවිධ චරිත ඉරියව් දැක්වෙන සිතුවමකි.
    2. වර්ණයේ හා ආලෝකයේ සබඳතාව පිළිබඳ පැස්ටල් මාධ්‍යයෙන් කල සිතුවමකි.
    3. ත්‍රිමාණ ලක්ෂණ දැක්වෙන පරිදි එළිය අඳුර දක්වා කළ සිතුවමකි.
    4. යථාරූපී චිත්‍රයක් තුළින් මානව රුව නිර්මාණයට ශිල්පීය හැකියාව පෙන්වන සිතුවමකි.
    5. මානව රුව තත්වාකාරයෙන් නිරූපනයට ගත් සාර්ථක උත්සහයක් දැක්වෙන සිතුවමකි.

14. D අක්ෂරයෙන් දැක්වෙන සිතුවම
    1. බටහිර කලා ලක්ෂණ අනුව වර්ණ මගින් ත්‍රිමාණ ලක්ෂණ පෙන්වූ නාරායන ස්වාමීගේය.
    2. වීර කාව්‍ය හා සාහිත්‍ය කෘති තේමා කරගත් රාජා රවී වර්මාගේය.
    3. රේඛා කේන්ද්‍රීය කරගෙන දෘශ්‍ය ප්‍රකාශන ගොඩනැගූ අබනීන්ද්‍රනාත් තාගෝර්ගේය.
    4. අජන්තා හා ඉන්දීය කලා ආභාසය වූ නන්දලාල් බෝස්ගේය.
    5. ඉන්දීය ඓතිහාසික ප්‍රවෘත්ති හා පුරාණෝක්ති වස්තු විෂය කරගත් ජෙමිනි රෝයිගේය.

15. E අක්ෂරයෙන් දැක්වෙන  වියුක්ත කරන ලක්ෂණ දැක්වෙන මෙම නිර්මාණය
    1. සංගතබව හා ඒකවාර්ණිකත්වය මූලික කරගත් රිචඩ් ගේබ්‍රියල්ගේය.
    2. දකුණු ආසියානු රූපාර්ථ මත ගොඩනැගූ එච්.ඒ.කරුණාරත්නගේය.
    3. අර්ධ වියුක්ත කරණ සහිත ස්ත්‍රී රූප ගොඩනැගූ ජස්ටින් දැරණියගලගේය.
    4. නූතනවාදී සහ පශ්චාත් උපස්ථිති වාදය සහිත ස්ටැන්ලි අබේසිංහගේය.
    5. සනිකවාදී කලාවේ ආභාස ලක්ෂණ සහිත ඒ. මාර්ක්ගේය.

*** ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් F, G, H, I, J ලෙස නම් කර ඇති කැටයම් ඡායාරූප ඇසුරෙන් තෝරන්න.**



F



G



H



I



J

16. F අක්ෂරයෙන් දැක්වෙනුයේ,
    1. අල්පෝන්නතව නිර්මාණය කළ කැටයමකි.
    2. සත්ත්ව රූප ඇතුළත් කැටයමකි.
    3. දාගැබේ සතර දිශාවට මුහුණලා කළ ස්තූප ආශ්‍රිත කැටයමකි.
    4. බොරදම් තීරු හැඩ හා විමාන ඇතුළත් කණ්ඨක චෛත්‍ය කැටයමකි.
    5. ගල් වඩුවාගේ විස්මිත නිර්මාණයකි.

17. G අක්ෂරයෙන් දැක්වෙන නටන වයන රූප පෙළ හමුවන්නේ,
    1. ඇම්බැක්කේ දේවාලයේ දිග්ගෙයි බාල්කයෙනි.
    2. ගඩොලාදෙණි විහාරයේ පාදමේ කැටයම් තීරු අතරෙනි.
    3. නාලන්දා ගෙඩිගෙයි පාදමේ කැටයම් අතරෙනි.
    4. පනාවිටිය අම්බලමේ පාදමේ දක්නට ඇති කැටයම් අතරෙනි.
    5. යාපහුව දළදා මැදුරේ පාදමේ කැටයම් අතරෙනි.

18. H අක්ෂරයෙන් දැක්වෙන හින්දු ආගමික මූර්තිය,
    1. අප්පර් ස්වාමි දැක්වෙන ශිව දේවාල ආශ්‍රිත චෝල මූර්තියකි.
    2. සුන්දර මූර්ති ස්වාමි දැක්වෙන ශිව දේවාල ආශ්‍රිත හින්දු මූර්තියකි.
    3. රාජ රාජේශ්වර දේවල ආශ්‍රිත ශිව පරම ගුරුවරයා ලෙස දැක්වෙන මූර්තියකි.
    4. රථ දේවාල ආශ්‍රිත විෂ්ණු දෙවියන් නිරූපිත පල්ලව මූර්තියකි.
    5. රාජ රාජේශ්වර දේවාල ආශ්‍රිත ශිව දක්ෂිණ මූර්තියකි.

19. I අක්ෂරයෙන් දැක්වෙන යුරෝපා කලා ඉතිහාසයේ දැකිය හැකි මෙම මූර්තිය,
    1. ග්‍රීක පෞරාණික යුගයේ නිම වූ කෝරේ මූර්තියකි.
    2. ග්‍රීක පෞරාණික යුගයේ නිම වූ කුරෝස් මූර්තියකි.
    3. ග්‍රීක හෙලනිස්ටික් යුගයේ නිම වූ සමෝත්‍රාස්හි විජයග්‍රහනයේ දෙවඟන මූර්තියයි.
    4. ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් ඇතීනා දෙවඟන මූර්තියයි.
    5. ග්‍රීක සම්භාව්‍ය යුගයට අයත් වීනස් දවඟන මූර්තියයි.

20. J අක්ෂරයෙන් දැක්වෙන ක්‍රි.ව. 315 දී අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රාහණ සිහි කිරීමට ඉදිකළ මෙය,
   1. ඩොරික්, අයෝනික්, කොරින්තිරියන් කුළුණු හිස් භාවිතයෙන් නිම කර ඇත.
   2. ට්‍රැජන් අධිරාජ්‍යයාගේ ඩේසියානු යුධ ජයග්‍රාණය දැක්වීමට ඉදිකර ඇත.
   3. රෝම වරුන්ගේ යුධ ජයග්‍රාහණ දැක්වීම සඳහා ඉදිකළ ආරුක්කුවක කැටයම් කොටසකි.
   4. පළමුවන කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රාහණ දැක්වෙන ආරුක්කු කැටයමකි.
   5. ටයිටස් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රාහණය දැක්වෙන රෝම ආරුක්කු කැටයමකි.

*** ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩා ගැළපෙන පිළිතුර පහත සඳහන් K, L, M, N, O යනුවෙන් නම් කර ඇති කලා කෘති ඇසුරෙන් තෝරන්න.**


K


L


M


N


O

21. K අක්ෂරයෙන් දැක්වෙන ගන්ධාර කලා නිර්මාණ අතර හමුවන මෙම බුදුරුව
   1. බ්‍රෙගම් බුදු පිළිමයයි.
   2. තක්තිබහී බුදු පිළිමයයි.
   3. හෝර්ටිමන්දාර් බුදු පිළිමයයි.
   4. සහිරි බහ්ලොල් බුදු පිළිමයයි.
   5. කනිෂ්ක කාසියේ දැක්වෙන බුදු පිළිමයයි.

22. L අක්ෂරයෙන් දැක්වෙන මෙම දේව රූපය,
   1. අර්ධ නාරී නටේෂ්වර මූර්තියයි.
   2. කල්‍යාණ සුන්දර මූර්තියයි.
   3. අවලෝකිතේෂ්වර බෝධිසත්ව ප්‍රතිමාවයි.
   4. මාලා තාරා නම් වූ මූර්තියයි.
   5. ශිව භික්ෂාටන මූර්තියයි.

23. M අක්ෂරයෙන් දැක්වෙන රෝම චිත්‍ර නිර්මාණ අතර හමුවන මෙය,
   1. කැරලි සහිත හිසකේ විලාසයක්ඇති මමී ආලේඛ්‍ය සිතුවමයි..
   2. ස්වයං ආලේඛ්‍ය සමග කටුමාලය නැමැති සිතුවමයි.
   3. හැරී පීරිස්ගේ ඉන්ද්‍රානි නැමැති සිතුවමයි.
   4. මේරි කසාට්ගේ හිසකෙස් සකසන ගැහැණු ළමයා සිතුවමයි.
   5. සීනාද සෙරම්ගේ ආලේඛ්‍ය සිතුවමයි.

24. N අක්ෂරයෙන් දැක්වෙන ලෝකඩ මාධ්‍ය යෙන් නිර්මිත මෙම මූර්තිය,
   1. අංක 05 ශිව දේවාලයෙන් සොයාගත් සුන්දර මූර්ති ස්වාමි මූර්තයයි.
   2. අංක 01 ශිව දේවාලයෙන් සොයාගත් පාර්වතී මූර්තියයි.
   3. ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයෙන් සොයාගත් නළඟන මූර්තියයි.
   4. ඉන්දු නම්න ශිෂ්ඨාචාරයේ සොයාගත් මව් දෙවඟන මූර්තියයි.
   5. ක්‍රි.ව.7-8 සියවස්වලට අයත් අර්ධනාරීෂ්වර මූර්තියයි.

25. O අක්ෂරයෙන් දැක්වෙන අසුන්ගේ ජංගම ශීලී ස්වභාවය සහිත මෙම කැටයම,
   1. භාරුත් ගල්වැට කැටයම් අතර හමුවන අභිනිෂ්ක්‍රමණ කැටයමයි.
   2. සංචියේ උතුරු තොරණේ දැක්වෙන අභිනිෂ්ක්‍රමණ කැටයමයි.
   3. සංචියේ නැගෙනහිර තොරණේ දැක්වෙන අභිනිෂ්ක්‍රමණ කැටයමයි.
   4. මාමල්ලපුරම්හි අර්ජුන්ගේ තපස විලාසය දැක්වෙන කැටයමයි.
   5. අමාරාවතී කැටයම් අතර හමුවන අභිනිෂ්ක්‍රමණ කැටයමයි.

*** ප්‍රශ්ණ අංක 26 සිට 30 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩා ගැළපෙන පිළිතුර තෝරන්න.**

26. ඝනිකාවාදී කලාව විශ්ලේෂණාත්මක ඝනිකවාදය හා සංස්ලේෂණාත්මක ඝනිකදවාදය යනුවෙන් කොටස් දෙකකි. විශ්ලේෂණාත්මක ඝනිකවාදය යනු,
    1. කුඩාකොටස්වලට කැඩුණු ඒකක ලෙස අළු පැහැයෙන් හෝ දුඹුරු පැහැයෙන් දැක්වීමයි.
    2. විශාල කොටස් වලට කැඩුණු ඒකක ලෙස කළු හෝ සුදු පැහැයෙන් දැක්වීම.
    3. වෙනස් හැඩ හා වෙනස් වයනයන් චිත්‍රයට එක්වීමයි.
    4. සියලුම පැති එකමතලකට ගෙන්වා දැක්වීමයි.
    5. කඩදාසි, ලී තහඩු ආදිය භාවිතයෙන් රසවත් පෘෂ්ඨ ගොඩනැගීමයි.

27. අධිතාත්විකවාදී නිර්මාණ ශිල්පීන්ගේ නිර්මාණ වන්නේ,
    1. නොමියෙන මතකය, නිල් පුටුව මත ගැහැණු ළමයා, ක්‍රීඩා කාලෝ දෙදෙනා
    2. ක්‍රීඩා කලෝ දෙදෙනා, නින්ද, කෝණ
    3. නින්ද, ස්ව අලේඛ්‍ය සමග කටු මාලය, නොමියෙන මතකය
    4. නැට්ටුවෝ, ස්ව ආලේඛ්‍ය සමග කටු මාලය, කෝණ
    5. නිල් පුටුව මත ගැහැණු ළමයා, කෝණ, නැට්ටුවෝ

28. පරිසර අධ්‍යයනයෙන් අනාවරණය කරගත් විවිධ හැඩ භාවිතා කර කාන්තා ආභරණ කට්ටලයක් නිර්මාණයේදී වඩාත් වැදගත් වනුයේ,
    1. නිර්මාණාත්මක හැඩතල තෝරගැනීමේදී අවධානය දැක්වීම.
    2. හැඩතල මතුකර ඇලංකාර සැරසිලි යෙදීම.
    3. මානව සාධක පිළිබඳ අවධානයෙන් සැලසුම් සකස් කිරීම.
    4. තෝරාගත් සැලසුමට අනුව චිත්‍ර ඇඳ ගැනීම.
    5. රිද්මය, සුසංගත බව, සමබරතාවය, ඒකත්වය, වැනි මොස්තර මූලධර්ම පිළිබඳ සැලකිලිමත් වීම.

29. මෝගල් කලාව හා රජ්පුට් කලාව සඳහා වාස්තු විෂයය වූයේ,
    1. එක සමාන තේමාවන් ඇසුරෙන් සිතුවම් ඇඳි සමකාලීන සම්ප්‍රදායන් දෙකකි.
    2. අනුපිළිවෙලින් රාජ්‍ය තේමා හා හින්දු ආගමික තේමා නිරූපිත සම්ප්‍රදායන් දෙකකි.
    3. අනුපිළිවෙලින් ආගමික තේමා හා ලෞකික තේමා නිරූපිත සම්ප්‍රදායන් දෙකකි.
    4. අනුපිළිවෙලින් රාජ්‍ය තොරතුරු හා සාමාජීය තොරතුරු නිරූපිත සම්ප්‍රදායන් දෙකකි.
    5. සංගීතයේ එන රාජයන්ගෙන් සිතුවම් නිර්මාණය කළ සම්ප්‍රදායන් දෙකකි.

30. ද්‍රව්‍ය සම්පින්ඩනයක් ඇඳීමේදී වඩාත් වැදගත් විය යුත්තේ,
    1. ආලෝකයට අනුව ද්‍රව්‍යවල හැඩ හා ත්‍රිමාණ ලක්‍ෂණ දැක්වීමයි.
    2. ද්‍රව්‍යයන් හොඳින් නිරීක්‍ෂණය කර එහි මතුපිට ස්වභාවයේ විවිධත්වය දැක්වීමයි.
    3. විවිධ මාධ්‍ය භාවිතයෙන් සම්පිණ්ඩනයේ එළිය, අඳුර දැක්වීමයි.
    4. පරිමාණය, ත්‍රිමාණ ලක්‍ෂණ, පර්යාවලෝකනය හා ගති ලක්‍ෂණ දැක්වීයි.
    5. ජ්‍යාමිතික උපකරණ භාවිතයෙන් තොරව නිදහස් අතින් ඇඳීමයි.

*** ප්‍රශ්ණ අංක 31 සිට 35 තෙක් එක් එක් ප්‍රශ්ණයට ඊට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**



31. මෙහි දැක්වෙන වාස්තු විද්‍යා අංගය
    1. පරාක්‍රම රජතුමා විසින් ඉදිකළ ගඩොලින් නිමකළ ආරුක්කු හැඩයේ පියස්සක් සහිත පිළිම ගෙයයි.
    2. පිටත බිත්ති වල විමාන හා කැටයම් දක්නට ඇති හුණු බදාමයන් කළ විජයෝත්පායයි.

3. පරාක්‍රමබාහු රජතුමා විසින් ඉදිකළ ත්‍රිභංග හැඩයේ බුදුපිළිමයක් දක්නට ඇති තිවංක පිළිම ගෙයයි.
4. දකුණු, ඉන්දීය ගෘහ නිර්මාණ ලක්ෂණ දැකිය හැකි අංක 1 ශිව දේවාලයයි.
5. පරාක්‍රමබාහු රජතුමාගේ කාලයේ ඉදිකල දැවයෙන් නිමකළ වහළයක් තිබෙන්නට ඇතැයි සැලකෙන ලංකාතිලක පිළිම ගෙයයි.

32. මෙහි දැක්වෙන ගෘහ නිර්මාණ ආකෘතියෙන් පෙන්වන්නේ,



1. ගාම්භීරත්වයෙන් යුත් ඩොරික් කළුණුය.
2. ඉරෙක්තියන් ගොඩනැගිල්ලේ ඇති අයොනික් කුළුණුය.
3. පාතිනොන් දේවස්ථානයේ ඇති ඩොරික් කුළුණුය.
4. බැටළු අං දෙකක් මෙන් ඇති අයොනික් කුළුණුය.
5. කැන්තස් පත්‍රවල රටා අසුරින් නිර්මාණය වූ කොරින්තියන් කුළුණුය.

33. පල්ලව කලා නිර්මාණ අතර හමුවන මෙම රථ දේවාලය,



1. අතු සෙවිලි කිරීම මූලධර්ම කරගත් වහලයක් සහිත ද්‍රෞපති රථ දේවාලයයි.
2. පිරමීඩාකාර වහළ හා අටපට්ටම් ශිඛරයකින් යුත් අර්ජුන රාත් දේවාලයයි.
3. මහල් දෙකකින් යුත් බොකටු වහලක් සහිත භීම රථ දේවාලයයි.
4. පිරමීඩාකාර වහළ හා අටපට්ටම් ශිඛර සහිත වෙරළේ දේවාළයයි.
5. විස්තරාත්මක කැටයම් හා ප්‍රතිරූප වලින් යුත් නකුල සහ දේව රථ දේවාලයයි.

34. රෝම වාස්තු විද්‍යා නිර්මාණ අතර හමුවන මෙය,




1. ට්‍රැජන් අධිරාජ්‍යයාගේ විජයග්‍රාහණය දැක්වෙන කුළුණු කැටයමකි.
2. කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ විජයග්‍රාහණය දැක්වෙන ආරුක්කු කැටයමකි.
3. ටයිටස් අධිරාජ්‍යයාගේ විජයග්‍රාහණය දැක්වෙන රෝම ආරුක්කු කැටයමකි.
4. ට්‍රැජන් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රාහණය දැක්වෙන රෝම ආරුක්කු කැටයමකි.
5. කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාගේ යුධ ජයග්‍රාහණය දැක්වෙන රෝම කුළුණු කැටයමකි.

35. මෙහි දක්නට ඇති උළුවහු හා වා කවුළු කැටයම,



1. ගඩොලාදෙණියේ ඉදිරිපස දක්නට ලැබෙන අංගයකි.
2. යපහුව මාළිගයේ ඉදිරිපස දක්නට ලැබෙන අංගයකි.
3. තිරියාය වටදාගෙයි ඉදිරිපස දක්නට ලැබෙන අංගයකි.
4. නිශ්ශංක ලතා මණ්ඩපයේ ඉදිරිපස දක්නට ලැබෙන අංගයකි.
5. නිල්ලක්ගම බෝධිඝරය ඉදිරිපස දක්නට ලැබෙන අංගයකි.

* **ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත්ම ගැළපෙන පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරින් තෝරන්න.**



36. මෙම සිතුවම දක්නට ලැබෙන්නේ
    1. කැළණිය නව විහාරයේ ය.
    2. දඹුලු ලෙන් විහාරයේ ය.
    3. දෙගල්දොරුව විහාරයේ ය.
    4. බෙල්ලන්විල රජ මහා විහාරයේ ය.
    5. මැදවල ටැම්පිට විහාරයේ ය.

37. මෙම සිතුවමට තේමා වී ඇත්තේ,
    1. නිළියකගේ විප්‍රකාර දැක්වීමයි.
    2. යක්ෂ දමනයයි.
    3. මාර පරාජයයි.
    4. බුද්ධත්වය ලැබීමයි.
    5. මහියංගනයට වැඩම කිරීමයි.

38. මෙම සිතුවම සංරචනය කිරීමේදී ශිල්පියා ,
    1. දකුණු ආසියානු සම්ප්‍රදායක, ආගමික හා නූතන කලා ප්‍රයෝග සුසංයෝගයෙන් නිර්මාණය කර ඇත.
    2. ස්වතන්ත්‍ර ශෛලිය පමණක් විද්‍යාමාන වන සේ නිර්මාණය කර ඇත.
    3. බෞද්ධ සාහිත්‍ය හා බැඳුණු සාම්ප්‍රදායික කලාව අනුව නිර්මාණය කර ඇත.
    4. යුරෝපීය නූතන කලා ලක්ෂණ භාවිතයෙන් නිර්මාණය කර ඇත.
    5. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී ක්‍රම අනුගමනය කරමින් නිර්මාණය කර ඇත.

39. මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ,
    1. දේශීය සම්ප්‍රදායන් ගරු කළ සොලියස් මෙන්ඩිස් ශිල්පියා විසිනි.
    2. නව ආරක චිත්‍ර සම්ප්‍රදායක් ගොඩනඟාගත් සෝම බන්දු විද්‍යාපති ශිල්පියා විසිනි.
    3. විහාර චිත්‍ර කලාවට මහඟු සේවයක් කළ මංජු ශ්‍රී විසිනි.
    4. විදේශීය අභාසය මත සිතුවම් කරණයේ යෙදුණු එම්. හාර්ලික් ශිල්පියා විසිනි.
    5. ස්වභාවික හා යථාර්ථවාදී රීති අනුව සිතුවම් නිර්මාණය කළ ඒ.සී.ජී.එස්.අමරසේකර ශිල්පියා විසිනි.

40. මෙම සිතුවම ඇඳීමේදී හා වර්ණ ගැන්වීමේදී,
    1. සිහින් දිගැටි හැඩ සමඟ සෞම්‍ය වර්ණ මාලාවක් භාවිත කර ඇත.
    2. ශරීරයේ මාංශ පේෂි උළුප්පා දැක්වීම උණුසුම් වර්ණ ඇසුරෙන් කර ඇත.
    3. රිද්මයානුකූල රේඛා සමඟ සමාන වර්ණ මාලාවක් භාවිතා කර ඇත.
    4. විවිධත්වයෙන් යුත් වස්ත්‍රාභරණ සමඟ සෞම්‍ය වර්ණ මාලාවක් යොදා ඇත.
    5. රිද්මයානුකූල රේඛා ඇසුරින් සිහින් දිගටි හැඩ සමඟ උණුසුම් වර්ණ මාලාවක් භාවිත කර ඇත.

## II කොටස

**උපදෙස් :-**

* මෙම කොටස අනු කොටස් තුනකින් සමන්විතය.
* ''අ'' කොටසින් ප්‍රශ්න දෙකක් හා ''ආ'' සහ ''ඉ'' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිලිතුරු සපයන්න. (අවශ්‍ය තැන්හි පිළිතුරු සවිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

### ''අ'' කොටස (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01. කොළඹ යුගයේ චිත්‍ර කලාව ඉතා උසස් කලා ලක්ෂණ පිළිඹිබු කර ඇත.
   (i) 43 කණ්ඩායමේ ශිල්පීන් දෙදෙනකු හා ඔවුන්ගේ සිතුවම් දෙකක් නම් කරන්න.
   (ii) එම් සාර්ලිස් හා සොලියස් මෙන්ඩිස් යන ශිල්පීන් දෙදෙනාගේ විහාර සිතුවම් කලාවේ දක්නට ලැබෙන සමාන අසමානතා කෙටියෙන් පහදන්න.
   (iii) ඩේවිඩ් පේන්ටර් හා ජෝර්ජ් කීට් ශිල්පියාගෙන් ආගමික සිතුවම් කලාවට සිදුවූ මෙහෙය පහත ශීර්ෂ ඔස්සේ විග්‍රහයක් කරන්න.
      (අ) වස්තු විෂය
      (ආ) ශෛලීය ලක්ෂණ
      (ඉ) ආභාසය
      (ඊ) වර්ණ භාවිතය

02. දකුණු ඉන්දීය චෝල වංශිකයෝ පොලොන්නරුව තම රාජධානිය කර ගැනීමත් සමග හින්දු ආගමික කලා නිර්මාණ රැසක් පොලොන්නරුවට දයාද විය.
   (i) පොළොන්නරුවෙන් හමුවූ හින්දු ආගමික ලෝකඩ මූර්ති 2ක් නම් කරන්න.
   (ii) නටරාජ පිළිරුවෙන් ප්‍රකාශිත සංකේත ඇසුරෙන් රය සංකේතාත්මක නිර්මාණයක් බවට කෙටි හැඳින්වීමක් කරන්න.
   (iii) මේ සමයේ බිහිවූ වාස්තු විද්‍යා ශිල්ප ක්‍රම ගම්පොල යුගය දක්වා පැතිර ගිය බවට එම යුගයේ ඉදි වූ බෞද්ධ ප්‍රතිමාඝර ඇසුරෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ කන්ද උඩරට චිත්‍ර කලාව, විහාර සිතුවම් කලාවට නවතම සම්ප්‍රදායක් එක් කිරීමට සමත් විය.
   (i) කන්ද උඩරට සිතුවම්වල දක්නට ලැබෙන සාම්ප්‍රදායික ලක්ෂණ 2ක් ලියන්න.
   (ii) කතළුව හා දෙගල්දොරුව විහාරයේ සිතුවම් සැසීදීමේදී දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
   (iii) උඩරට සිතුවම් කලාව පහතරට විහාර කරා පැතිර යාමේදී වෙනස්කම් රැසකට භාජනය විය. පහත සඳහන් ශීර්ෂ යටතේ උදාහරණ සහිතව පහදන්න.
      (අ) වාස්තු විශය
      (ආ) ශිල්ප ක්‍රමය
      (ඇ) ශෛලීය ලක්ෂණ
      (ඈ) වර්ණ භාවිතය හා තලය සංවිධානය

''ආ'' කොටස (චිත්‍ර කලාව ඇගයීම හා රසස්වාදය - ඉන්දීය

04. ක්‍රි.ව. 1 සිට ක්‍රි.ව. 5 දක්වා කාලය තුළ ගන්ධාරය බෞද්ධ කලා මධ්‍යස්ථානයක්ව පැවති අතර එය භාරත ඉතිහාසය තුළ වැදගත් ස්ථානයක් හිමිකර ගනී,

(i) ගන්ධාර ශිල්පීන් වෙතින් නිමවූ බුදුපිළිම 2ක් ලියන්න.

(ii) ගන්ධාර කලා සම්ප්‍රදායට සමකාලීනව මථුරා කලා සම්ප්‍රදාය බිහිවූ අතර ගන්ධාර පිළිම වලට වඩා මථුරා බුදු පිළිම දේශිය සංකල්ප කෙරේ වැඩි නැඹුරුවක් දැක්වූ බව උදාහරණ සහිතව කෙටියෙන් පහදන්න.

(iii) ගාන්ධාර පිළිමවලට වඩා මථුරා බුදුපිළිම සංවර්ධිත අවස්ථාවට පත්ව ඇති බවට කත්‍රා බුදු පිළිමය ඇසුරෙන් පහත ශීර්ෂ යටතේ විමසන්න.

(අ) අභාසය

(ආ) සමබරතාවය

(ඉ) මධ්‍ය භාවිතය

(ඊ) කලාත්මක ලක්ෂණ

05. යුරෝපීය ශාස්ත්‍රාලයට එරෙහිව යමින් ඉන්දීය හා පෙරදිග කලාරීති අනුගමනය කිරීම ඉන්දීය නව ජීවන ව්‍යාපාරය තුළ සිදුවිය.

(i) අබනීන්ද්‍රනාත් තාගෝර්ගේ සිතුවම් දෙකක් ලියන්න.

(ii) නන්දලාල් බොස්ගේ නිර්මාණ තුල දක්නට ලැබෙන කලාත්මක ලක්ෂණ පිළිබඳ කෙටි හැඳීන්වීමක් කරන්න.

(iii) ඉන්දියානු ස්වදේශීක කලා ශෛලීන් සහ යුරෝපීය නූතන කලා ශෛලීන් මොහුගේ සිතුවම් තුළින් දැකිය හැකිය. මොහුගේ සිතුවම්වල කලා ලක්ෂණ ඇසුරෙන් ඒ පිළිබඳ ඇගයීමක් කරන්න.

''ඉ'' කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසස්වාදය - යුරෝපය)

06. කාලයත් සමග උපස්ථිතිවාදී තේමා සහ ශිල්ප ක්‍රම ඒකාකාරීත්වයට පත්වෙමින් තිබූ අතර එයට එදිරි ප්‍රතික්‍රියාවක් ලෙස පශ්චාත් උපස්ථිතිවාදය බිහි විය.

(i) පාශ්චාත් උපස්ථිතිවාදී ශිල්පීන් දෙදෙනෙකු නම් කරන්න.

(ii) පශ්චාත් උපස්ථිතිවාදී ශිල්පියෙකු විසින් නිර්මාණය කළ දෙවියන්ගේ දිනය සිතුවම පිළිබඳ කලාත්මක විමසුමක් කරන්න.

(iii) පුනරුද දෘෂ්ටි කෝණ ඔස්සේ තම සිතුවම් ගොඩනැගීමට එඩිගා ඩෙගා වැඩි රුචියක් නොදැක්වූ අතර ඔහුගේ සිතුවම් හදිසියේ ගත් ඡායාරූපයක් වැනිය. ඔවුගේ නිර්මාණ ඇසුරෙන් මේ කියමන සනාථ කරන්න.

07. රෝමවරුන් තම යුධ ජයග්‍රාහණය සිහිවීම පිණිස ඉදිකළ නිර්මාණ ඔවුන්ගේ අභිමානවත් නිර්මාණයෝය.

(i) රෝමවරු තම යුධ ජයග්‍රාණ සිහිවීම පිණිස ඉදිකල ස්මාරක වර්ග දෙක ලියන්න.

(ii) ඩොරික් කුළුණු ස්වරූපයට, ට්‍රජන් අධිරාජ්‍යයාගේ බැසිලිකාව අසල ඉදිකර ඇති ස්මාරකය නම් කර ඒ පිළිබඳ කලාත්මක ඇගයීමක් කරන්න.

(iii) රෝමවරු ආරම්භයේදී ග්‍රීකයන් අනුකරණය කළද ග්‍රීක නිර්මාණ අභිබවා යාමට ඔවුන් සමත් විය. පහත ශීර්ෂ යටතේ ඔවුන්ගේ මූර්ති ඇසුරෙන් ඉහත කියමන සනාථ කරන්න.

(අ) මාධ්‍ය

(ආ) වස්තු විෂයය

(ඉ) ආභාසය හා ශෛලීය ලක්ෂණ

(ඊ) කලා ලක්ෂණ

## III කොටස

උපදෙස් :-

- * ඔබේ විභාග අංකය හා තෝරාගත් ප්‍රශ්න අංකය ඔබ චිත්‍රය අදින කඩදාසියේ පිටුපසෙහි පැහැදිලිව ලියන්න.
- * දිය සායම්, පොස්ටර් සායම්,කුඩු සායම්,පැස්ටල් යන එක් මාධ්‍යයක් හෝ මාධ්‍යයක් කිහිපයක් මිශ්‍රිතව හෝ භාවිතා කළ හැකිය
- * අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.
- * චිත්‍රය භාරදෙන විට එය සම්පූර්ණයෙන්ම වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින් එය ඔබට අවාසි දායක විය හැකිය.
- * පහත සඳහන් අ,ආ සහ ඉ යන කොටස් තුන අතුරෙන් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණ චිත්‍රයක් නිර්මාණය කරන්න.

### ''අ'' කොටස - චිත්‍ර සංරචනය

01. රාත්‍රියක ආගමික පුද පූජා වෙත යොමු වන බැතිමතුන්
02. සන්ධ්‍යාවේ මුහුදු වෙරළේ පැවැත්වෙන විනෝද ජනක අවස්ථාවක්
03. ජලාශ්‍රිත වන ලැහැබක නිදහසේ සැරිසරන වන සතුන්/වෙහෙස වූ ගොවියන්ව ඇඹුල බෙදන අවස්ථාවක්

### ''ආ'' කොටස- මෝස්තර නිර්මාණය

04. වියුක්ත රූපී මලක හැඩයක් හා කොළයක හැඩයක් යොදා ගනිමින් අඟල් 9X9 ප්‍රමාණයේ ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
05. කුඩයට සුදුසු මෝස්තරයක් සත්ත්ව රූප ඇසුරෙන් නිර්මාණය කරන්න. (පැති අටක් සහිත)
06. කුෂන් කවරයක් සඳහා අඟල් 9X9 ප්‍රමාණයේ අවකාශයක් තුල සාම්ප්‍රදායික මොස්තර ඇසුරෙන් නිර්මාණය කරන්න.

### ''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

07. විවිධ ව්‍යසන හමුවේ සිසුන්ගේ අධ්‍යාපනය නගා සිටුවිය යුතු ආකාරය පිළිබඳ පුවත්පතකට සුදුසු වර්ණවත් සන්නිදර්ශන චිත්‍රයක් නිර්මාණය කරන්න.
08. ''සමාජ සංහිඳීයාව සැලසිය යුත්තේ ආගම දහම තුළිනි '' මැයින් පෝස්ටරයකට සුදුසු විචිත්‍රවත් සැලසුමක් නිර්මාණය කරන්න.
09. දේශීයව නිෂ්පාදිත කාන්තා ඇඳුමකට සුදුසු විලාසිතාවක් සැලසුම් කර සැරසිලි කරන්න.